# රැකියා පුරප්පාඩු

## සී/ස කුරුණෑගල වැවිලි සමාගම

### (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය)

**වතු අධිකාරී තනතුර (Area Superintendent)**

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය/ විද්‍යාව/ වැවිලි කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිධාරියෙකු වීම සහ උක්ත සුදුසුකම සපුරා ගැනීමෙන් අනතුරුව රජය සතු සමාගමක/ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ වැවිලි සමාගමක විධායක ශ්‍රේණියේ වසර 05 කට නොඅඩු පළපුරුද්ද හා ඉන් වසර 03 ක් වතු අධිකාරීවරයෙකු/ කළමනාකරුවෙකු ලෙස පළපුරුද්ද

**හෝ**

පිළිගත් ආයතනයකින් ලබා ගත් වැවිලි කළමනාකරණය/ කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාව **සහ** උක්ත සුදුසුකම සපුරා ගැනීමෙන් අනතුරුව රජය සතු සමාගමක/ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ වැවිලි සමාගමක විධායක ශ්‍රේණියේ වසර 08 කට නොඅඩු පළපුරුද්ද හා ඉන් වසර 03 ක් වතු අධිකාරීවරයෙකු/ කළමනාකරුවෙකු ලෙස පළපුරුද්ද

**අභ්‍යන්තර**

**කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ 1 ශ්‍රේණියේ** සහකාර වතු අධිකාරීවරයෙකු ලෙස වසර 05 කට නොඅඩු පළපුරුද්ද

**වැටුප**

තෝරාගනු ලබන අයදුම්කරු පහත වැටුප් ව්‍යුහය යටතේ සේවයට අනුයුක්ත කරනු ඇත.

MM 1 - 1 රු.91,690/= ( රු.2,480/= X 10 + රු.3,450/= X 15 = රු.168,240/=

මීට අමතරව ජීවන වියදම් දීමනාව සඳහාද තෝරාගනු ලබන අයදුම්කරු හිමිකම් ලබනු ඇත.

**වයස**

වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බල නොපානු ඇත.

**සහකාර වතු අධිකාරී තනතුර (Assistant Superintendent)**

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය/ විද්‍යාව/ වැවිලි කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිධාරියෙකු වීම **සහ** උක්ත සුදුසුකම සපුරා ගැනීමෙන් අනතුරුව රජය සතු සමාගමක/ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ වැවිලි සමාගමක වසර 03 කට නොඅඩු පළපුරුද්ද

**හෝ**

පිළිගත් ආයතනයකින් ලබාගත් වැවිලි කළමනාකරණය/ කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාව සහ උක්ත සුදුසුකම සපුරා ගැනීමෙන් අනතුරුව රජය සතු සමාගමක/ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ වැවිලි සමාගමක වසර 05 කට නොඅඩු පළපුරුද්ද

**හෝ**

ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළත්ව අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් සමත්වීම **සහ** සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ පවතින සාමූහික ගිවිසුම යටතේ ස්ථාන භාර නිලධාරීවරයෙකු ලෙස වැවිලි ක්ෂේත්‍රයේ වසර 10 කට නොඅඩු පළපුරුද්ද

**වැටුප**

තෝරාගනු ලබන අයදුම්කරු පහත වැටුප් ව්‍යුහය යටතේ සේවයට අනුයුක්ත කරනු ඇත.

JM 1 - 1 රු.72,650/= ( රු.1,360/= X 10 + රු.2,040/= X 18 = රු.122,970/=

මීට අමතරව ජීවන වියදම් දීමනාව සඳහාද තෝරාගනු ලබන අයදුම්කරු හිමිකම් ලබනු ඇත.

**වයස**

වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බල නොපානු ඇත.

**අනිකුත් පහසුකම්**

වතු අධිකාරී තනතුර සඳහා පුද්ගලික ධාවනයද සහිතව ආයතනය මගින් නඩත්තු කරන නිල මෝටර් රථයක් සහ සහකාර වතු අධිකාරී තනතුර සඳහා පුද්ගලික ධාවනයද සහිතව ආයතනය මගින් නඩත්තු කරන යතුරුපැදියක් සඳහා හිමිකම් ලබනු ඇත. මීට අමතරව ගෘහභාණ්ඩ සහිතව නිල නිවසක්, ආයතනය විසින් සම්පූර්ණයෙන්ම දයකවන රෝහල් ගත වීමේ රක්ෂණාවරණයක්, වාර්ෂික ප්‍රසාද දීමනා සහ කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා හා තනතුරට අදාළ අනෙකුත් වරප්‍රසාද සඳහා ඉහත තනතුරු දෙක සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් හිමිකම් ලබනු ඇත.

**පොල්/ රබර් වැවිලි කළමනාකරණය, භෝග විවිධාංගීකරණය, කාර්මික සම්බන්ධතා සහ පරිගණක භාවිතය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකම් වනු ඇත.**

අදාළ සහතිකවල පිටපත්ද සමග අයදුම්කරු ගැන විමසීම් කළහැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම්පතෙහි සඳහන් කර ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කර **මානව සම්පත් හා පරිපාලන කළමනාකරු, සී/ස කුරුණෑගල වැවිලි සමාගම, නො.80, දඹුල්ල පාර, කුරුණෑගල** යන ලිපිනයට 2026 ජූලි මස 08 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු හෝ මණ්ඩල වල සේවයේ නියුක්ත වූවන් අයදුම් කරන්නේනම් අදාළ ආයතන ප්‍රධානියාගේ අනුමැතිය සහිතව අයදුම් කළ යුතුය. ඍජුව තාවකාලික අයදුම්පතක් (Advance Copy) යොමු කළ හැකිය.

**බඳවා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සැලකීමට හේතුවක් වනු ඇත.**